**කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතිය - 01 කොටස -2020**

---

කෘෂිකාර්මික අංශය නවීකරණ සඳහා වූ ව්‍යාපෘතියේ 01 කොටස 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය අතර 2017 ජනවාරි 17 දින එළඹි අංක 5873 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛණ 02 හි 11 ආ.3 වගන්තියේ සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

---

ව්‍යාපෘතියේ 01 කොටසේ මූල්‍ය ගිවිසුම අනුව, එවකට ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය වර්තමානයේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවීමේ හා කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු, නැගෙනහිර, උතුරු මැද, මධ්‍යම සහ ඌව පළාත්වල කෘෂි ඵලදායීතාවය ඉහළ නැංවීම, වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ ගොවීන්ගේ හා කෘෂි ව්‍යාපාර මගින් කෙරෙන අගය එකතු කිරීම් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ආයෝජනයන් සකස් කිරීමේ සහය, ගොවි නිෂ්පාදන සංවිධාන සහ කෘෂි ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ප්‍රදානය, කොටස් වශයෙන් ණය සඳහා ඇපවීම යනාදී සංරචක 3ක් යටතේ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක වේ. මූල්‍ය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 15,612 කට සමාන එජඩො මිලියන 106.97ක් වන අතර ඉන් රු.මිලියන 9,176කට සමාන එජඩො මිලියන 63ක් සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන සමායතනය එකඟ වී තිබුණි.ඉතිරි මුදල වන රු.මිලියන 6,436කට සමාන එජඩො මිලියන 44ක් ප්‍රතිලාභීන් විසින් සැපයීමට අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු පසු මුල්‍යනය යටතේ 2016 ඔක්තෝබර් 15 දින ආරම්භ කරන ලද අතර 2021 ඔක්තෝබර් 31 වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණි.

**1.3 තත්ත්වාගනය කළ මතය**

---

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර , ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණය**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

# 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරණ අඩුපාඩු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට ප්‍රතිලාභීන් විසින් කරන ලැබූ දායකත්වය වෙනම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර නොතිබුණි. | වර්තමානයේ ප්‍රතිලාභීන්ගේ දායකත්වය ගිණුම්ගත කිරීමට ක්‍රමවේදයක් නොමැත. | ව්‍යාපෘතිය ප්‍රතිලාභීන්ගේ දායකත්වය හඳුනා ගත යුතු අතර දායකත්වයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වෙනම හෙළිදරව් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාග්ධන ගැලපුම් දීමනාව පාලන ගිණුමේ සහ ප්‍රාග්ධන ගැලපුම් දීමනා ණයහිමි ගිණුමේ ශේෂයන් සමාන විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල එම ගිණුම් අතර රු. **3,962,166**ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස සම්බන්ධයෙන් අපි එකඟ වන අතර එය **2021** වර්තමාන වර්ෂයේ සංසන්දනය කරනු ලැබේ. | වෙනස හදුනා ගැනීමට සහ වැරදි නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

**3.** භෞතික කාර්යසාධනය
------------------------

**3.1** ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය
----------------------------------------------------------------

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක **3** ක් යටතේ ක්‍රියාත්මක වේ.

(අ) ආයෝජන පිළියෙල කිරීම සඳහා සහාය.

(ආ) ගොවි නිෂ්පාදන සංවිධාන හා කෘෂි ව්‍යාපාර සඳහා ගැලපුම් ප්‍රදාන ප්‍රදානය කිරීම.

(ඇ) ණය සඳහා කොටසකට ඇපවීම.

| | සංරචකය | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ලබාදීම | (i) ආරම්භයේදී ප්‍රාග්ධන ගැලපුම් දීමනාව වැඩසටහන ඉහළ දරිද්‍රතාවයකින් යුත් ප්‍රමුඛ දිස්ත්‍රික්ක හතක ආසන්න වශයෙන් ගොවි නිෂ්පාදන සංවිධාන **350** සහය ලබාදීමට හඳුනාගෙන තිබුණි. ඉන්පසුව කොළඹ ඇතුළුව දිස්ත්‍රික්ක **15** වැඩි ප්‍රමාණයක් ව්‍යාපෘතියට එකතු කර තිබුණි. මෙම අලුතින් එකතු වූ දිස්ත්‍රික්කවලින් ගම්පහ, කළුතර සහ කුරුණෑගල දිස්ත්‍රික්ක සඳහා මුළු ප්‍රතිපාදනයෙන් සියයට **74** වෙන් කර තිබුණි. | ව්‍යාපෘතිය විශාල ප්‍රමාණයේ දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර මෙම හඳුනාගත් දිස්ත්‍රික්කවල මෙම ප්‍රතිපාදන යොජනා ක්‍රමය පිළිබඳව ආයෝජකයින් දැනුවත් කිරීමට සියළුම පියවර ගන්නා ලදී. දරිද්‍රතාවයෙන් ඉහළ දිස්ත්‍රික්කවලින් අඩු ප්‍රතිචාරය හේතුවෙන් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ඉහළ ආයෝජකයන් සහිත වැඩි හැකියාවක් ඇති ව්‍යාපෘති සඳහා වෙනත් දිස්ත්‍රික්කවලින් ආයෝජන යෝජනා පිළිබඳ සැලකීමට සිදු විය. | ව්‍යාපෘතියේ අරමුණු අත්පත් කර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය. |
| | | (ii) ව්‍යාපෘතිය **2020** දෙසැම්බර් **31** දක්වා යෝජිත සමාගම් **65** වෙත ලබාදීමට එකතුව රු. මිලියන **1,184.07**ක් ප්‍රාග්ධන ගැලපුම් දීමනාව ප්‍රදාන ලෙස අනුමත කර | පහත සඳහන් හේතු නිසා ප්‍රධාන වශයෙන් ප්‍රමාද වී ඇත. ව්‍යාපෘති ආරම්භ කිරීමට සූදානමක් නොමැතිවීම, නියමිත වේලාවට නීති ලියවිලි | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | තිබුණද, අනුමත කරන ලද දින සිට මාස 06 සිට මාස 30 ක කාලයක් ගත වී ඇතත් ප්‍රාග්ධන ගැලපුම් දීමනාව නිදහස් කොට නොතිබුණි. | ඉදිරිපත් කර නොතිබීම, කොවිඩ් 19 නිසා, ව්‍යාපෘති ආරම්භක අවස්ථාවේදී අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදය සහ යෝජනා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් | |
| | | **(iii)** රු. මිලියන 341 අනුමත ප්‍රදානවලින් 2020 දෙසැම්බර් 31 දක්වා දෙවැනි ප්‍රදාන රු. මිලියන 144 නිදහස් කර නොතිබුණද, අසම්පූර්ණ වැඩ හේතුවෙන් පළමු වාරිකය නිකුත් කර මාස 05 සිට 15 දක්වා ගත වී තිබුණි. | ව්‍යාපෘතියේ ස්වභාවය සහ ගෝලීය වශයෙන් පනවන ලද සංරවක සීමා මත ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීමට නොහැකිවීම ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් හේතු විය. | -එම- |
| | | **(iv)** ආයෝජකයින් 232 දෙනෙකු සඳහා 2017, 2018 සහ 2019 වර්ෂවලදී අනුමත ප්‍රදාන රු. මිලියන 4,830 ලබාදී තිබුණු අතර වර්ෂ දෙකේ සිට තුනක කාලපරිච්ඡේදයක් ඉක්මවා තිබුණි. කෙසේවෙතත්, 2020 වර්ෂය අවසානය වන විට ආයෝජකයින් 04 දෙනෙකු පමණක් රු. මිලියන 57.83 ක ඔවුන්ගේ ආයෝජන නිමකර තිබුණි. | අනවශ්‍ය ප්‍රමාදයන් ඉවත් කරමින් දෙපාර්ශවයම කටයුතු කරන අතර සඳහන් පරාමිතීන් තුළ අදියරයන් කඩිනම් කරනු ලැබේ. | ව්‍යාපෘතියේ අරමුණු අත්පත් කර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය. |
| **(ආ)** | ණය සඳහා කොටසකට ඇප වීම | ව්‍යාපෘතියේ ණය සඳහා කොටසකට ඇප වීම සංරචකය යටතේ කටයුතු සිදු කිරීමට එ.ජ.ඩො මිලියන 7.12ක මුදලික් වෙන්කර තිබුණු අතර 2020 දෙසැම්බර් 31 දක්වා එය උපයෝජනය කර නොතිබුණි. | ණය සඳහා කොටසකට ඇප වීම පිළිබඳ විගණකගේ මතය නිවැරදි අතර පිළිගනු ලැබේ. | මෙම ණය යෝජනා ක්‍රමය පෞද්ගලික බැංකු මගින් ක්‍රියාත්මක කිරීමට සහාය ලබා ගැනීමට පියවර ගත යුතුය. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| සුළු හා කුඩා ව්‍යාපෘති සඳහා ව්‍යාපාර යෝජනා සකස් කිරීමට සහාය ලබා ගැනීමට ව්‍යාපෘතිය උපදේශන සමාගමක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර නොගැනීම හේතුවෙන් රු.මිලියන 1.97 ක් ගෙවීමෙන් පසු කොන්ත්‍රාත් කටයුතු අවසන් කර තිබුණි. | ගෙවීම් ගිවිසුමට අනුව සහ හොඳ කාර්යසාධනයක් සහ සේවා සැපයීම මත සිදු කළ අතර ගෙවීම් සනාථ කෙරේ. | ව්‍යාපෘතියේ අරමුණු සමග අනුකූලවීම අවශ්‍ය අතර ව්‍යාපෘතියේ මෙහෙයුම් පිරිවැය අවම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**3.3 ඌනඋපයෝජිත සම්පත්**

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර වර්ෂ දෙකක් ගතවීමෙන් පසු ණය නියෝජිතායතනය විසින් කරන ලද රු. මිලියන 8,869.38ට සමාන එ.ජ.ඩො. මිලියන 60.77ක මුළු ප්‍රතිපාදනයෙන් සියයට 21.54ක් නියෝජනය කරන රු. මිලියන 2,135.42කට සමාන එ.ජ.ඩො මිලියන 13.09ක් පමණක් 2020 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. | උපයෝජනය සියයට 21.54ක් නොව සියයට 33 කි. | ව්‍යාපෘතියේ අරමුණු අත්පත් කර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය. |

**3.4 පරිබාහිර කටයුතු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ අරමුණුවලට අදාළ නොවන අයදුම්පත්‍ර මුද්‍රණය කිරීම සම්බන්ධයෙන් එකතුව රු.213,000ක් වැය කර තිබුණු අතර ඒවා ගබඩාවල නිශ්කාර්යව පැවතුණි. | සමාජ සුභසාධක සහ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින සමෘද්ධි සංවර්ධන සමඟ සමගාමීව ක්‍රියාත්මක කිරීමට නියමිත ගොවි ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා භාවිතයට ගැනීමට මෙම අයදුම්පත් පෝරම මුද්‍රණය කර ඇත. | ව්‍යාපෘතියේ අරමුණු අත්පත් කර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියට අයත් නොවන වාහනයක් අළුත් වැඩියා පිරිවැය ලෙස එකතුව රු.270,000ක් ව්‍යාපෘතිය වැය කර තිබුණි. | ආරම්භයේදී ව්‍යාපෘතියේ වාහන නොතිබීම නිසා රේඛීය අමාත්‍යාංශය මගින් ව්‍යාපෘති අධ්‍යක්ෂක වෙත වෙන් කරන ලද වාහන සඳහා 2018 දී මෙම වාහන අළුත්වැඩියා සිදු කරන ලදී. | ව්‍යාපෘතියේ අරමුණු අත්පත් කර ගැනීමේ අරමුණින් ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය |